# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2011
2013 මැයි - අගෝස්තු

මානවශාස්ත්‍ර පීඨය

ප්‍රතිබිම්බ කලා - IMAT- E1025

ව්‍යවහාරික ඡායාරූපකරණය

**ඕනෑ ම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.**

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි | කාලය : පැය 03 යි

---

01. දෛනික ජන ජීවිතය කෙරෙහි ඡායාරූප ශිල්පයේ බලපෑම කවරාකාර දැයි පැහැදිලි කොට, ගෘහස්ථ ඡායාරූප ඇසුර පිළිබඳ විග්‍රහයක් කරන්න.

02. චිත්‍රාගාර ඡායාරූපකරණය සහ එළිමහන් ඡායාරූපකරණය අතර වන සම - විසමතා සංසන්දනය කරන්න.

03. වනජීවී ඡායාරූපකරණයේ යෙදෙන ඡායාරූප ශිල්පියෙකු සතුව තිබිය යුතු ආම්පන්න ලැයිස්තුවක් පිළියෙළ කොට, ඉන් වඩාත් අත්‍යවශ්‍ය යැයි ඔබ අදහස් කරන උපකරණ පහක් පිළිබඳ කෙටි විමසීමක් කරන්න.

04. අංකිත (Digital) තාක්ෂණයේ ආගමනයත් සමග තාක්ෂණික හා ව්‍යවහාරික වශයෙන් ඡායාරූප ශිල්ප ක්ෂේත්‍රය තුළ සිදුව ඇති වෙනස්කම් අළලා පුවත්පත් ලිපියක් සම්පාදනය කරන්න.

05. කෙටි සටහන් ලියන්න.

    i. වාස්තු විද්‍යාත්මක ඡායාරූපකරණය (Architectural Photography)
    ii. ඡායාරූප සංස්කාරක (Photo editor)
    iii. යුසුෆ් කාශ් (Yusuf Kash)
    iv. ලෝක ප්‍රවෘත්ති ඡායාරූප සංවිධානය (World Press Photo)

06. ඡායාරූපමය පුවත්පත් කලාව යන්න හඳුන්වා, එම ක්ෂේත්‍රයට අවතීර්ණ වන ශිල්පියෙකු සතුව තිබිය යුතු සුදුසුකම් කවරේ දැයි ලියා දක්වන්න.

07. සරණ මංගල්‍ය ඡායාරූපකරණය නූතන ලාංකේය සමාජය තුළ ස්ථාපිත වී ඇති ආකාරය විමර්ශනය කොට, එම ක්ෂේත්‍රයේ නියැලෙන්නෙකු විසින් පිළිපැදිය යුතු ආචාරධර්ම මාලාවක් යෝජනා කරන්න.

08. ඡායාරූප ශිල්පය, අධ්‍යාපන, සංස්කෘතික සහ ජනමාධ්‍ය ක්ෂේත්‍රයන්හි අභිවෘද්ධිය සඳහා යොදාගත හැක්කේ කෙසේ දැයි සාකච්ඡා කරන්න.

***********************